REFERENCE ONLY

ද මැසිනොද් විදුහල කඳාන

**De Mazenod College - Kandana**

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

පැය 2

දෙවන වාර පරීක්ෂණය 2016

20-07-2016

10 ශ්‍රේණිය

*පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසින් ප්‍රශ්න දෙකක්ද II කොටසින් ප්‍රශ්න දෙකක්ද බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.*

01) මනීෂා ළමා ඇඟළුම් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාර ආයතනයක් ආරම්භ කිරීමේ අපේක්ෂාවෙන් සිටියි. ඇය තම ඉතිරිකිරීමේ ගිණුමේ වූ රු. 300 000ක් ආයෝජනය කිරීමෙන් ව්‍යාපාරය ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. ඇය පිළිගැනීමක් සහිත ආයතනයක මැහුම් පාඨමාලාවක් අදාරා ඇත. ඇය රු. 100000කට මහන මැෂින් 2ක් මිලදී ගැනීමට සැළසුම්කර ඇත. එසේම ඇය මාස 3කට පසු තම හොඳම යෙහෙලිය වන කමලාව තම ව්‍යාපාරයට සම්බන්ධකර ගැනීමට තීරණය කර ඇත. නමුත් මනීෂාගේ මවගේ අදහස වනුයේ යෙහෙලිය සම්බන්ධකර නොගෙන ව්‍යාපාරය පවතින ආකාරයෙන්ම පවත්වාගෙනයාම යෝග්‍ය බවයි. එසේම මනීෂා රු. 200000ක බැංකු ණයක් ලබා ගැනීමට සැළසුම් කර ඇත.

i. මනීෂා පළමුව ආරම්භ කිරීමට සූදානම් වුනයේ කුමන වර්ගයේ ව්‍යාපාර සංවිධානයක්ද ?
ii. එම ව්‍යාපාර සංවිධාන වර්ගයේ ලක්ෂණ 2ක් සඳහන් කරන්න.
iii. මනීෂාගේ ව්‍යාපාරයේ ශක්තීන් 2ක් දක්වන්න.
iv. මනීෂා තම යෙහෙලියව සම්බන්ධ කර ගන්නේ නම් ඔවුන්ට සුදුසු ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද ?
v. ඉහත ව්‍යාපාර සංවිධාන වර්ගයේ අවසි 2ක් දක්වන්න.
vi. මනීෂා සිදු කිරීමට අපේක්ෂායෙන් සිටින ගනුදෙනු මූලික ගිණුම් කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න.
vii. මනීෂා තම ව්‍යාපාරයෙන් ඉටුකරගැනීමට බලාපොරෝත්තු වන අරමුණු 2ක් ලියා දක්වන්න.
viii. මනීෂා ව්‍යාපාරයට ලබාදිය යුතු දායකත්වයන් 2ක් දක්වන්න.
ix. මනීෂාගේ ව්‍යාපාරයේ පවතින වත්කමක් හා වගකීමක් සඳහා උදාහරණයක් බැගින් දක්වන්න.
x. මනීෂාගේ ව්‍යාපාරයේ මුදල් ලැබීම් 2ක් දක්වන්න.

ලකුණු 20

## I කොටස

*ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.*

02) ව්‍යාපාරයකට භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා විවිධ සම්පත් අවශ්‍ය වේ. මෙසේ අවශ්‍ය වන සම්පත් නිෂ්පාදන සාධක ලෙස හැඳින්වේ,

i. නිෂ්පාදන සාධක 04 දක්වන්න.
ii. ඉහත නිෂ්පදන සාධක සඳහා උදාහරණයක් දක්වන්න.
iii. ව්‍යාපාරයකට ඇල්මැති පාර්ශව 4ක් දක්වන්න.
iv. අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් 4ක් දක්වන්න.
v. සේවා සැපයීමේ ව්‍යාපාර සඳහා නිදසුන් 4ක් දක්වන්න.

ලකුණු 10

03) ව්‍යාපාර පරිසරය ප්‍රධාන වශයෙන් අභ්‍යන්තර පරිසරය හා බාහිර පරිසරය ලෙස බෙදා දැක්විය හැකිය.

i. අභ්‍යන්තර පරිසරයේ ඇතුළත් පාර්ශව 3ක් ලියා දක්වන්න.
ii. ව්‍යාපාරයකට බලපෑම් ඇති කරන බාහිර පාරිසරික සාධක 4ක් ලියා දක්වන්න.
iii. ව්‍යාපාර ආයතනයක ශක්තීන් හා දුර්වලතා සඳහා උදාහරණ 2 බැගින් දක්වන්න.
iv. ව්‍යාපාර ආයතනයක අවස්ථා හා තර්ජන සඳහා උදාහරණ 2 බැගින් දක්වන්න.
v. දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන හිතකර බලපෑම් හා අහිතකර බලපෑම් 2 බැගින් දක්වන්න.

ලකුණු 10

04) ව්‍යාපාර විවිධ ආකාරයට සංවිධානය වී ඇත. මෙම විවිධ ස්වරූපවල ව්‍යාපාර සංවිධාන වර්ග විවිධ නිර්ණායක මත වර්ග කළ හැකිය.

i. හිමිකාරිත්වය මත ව්‍යාපාර සංවිධාන වර්ග කරන්න.

ii. ඉහත වර්ගකිරීම සඳහා උදාහරණ 2 බැගින් දක්වන්න.

iii. පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේදී ව්‍යාපාරයක පරිමාණය තීරණය සඳහා යොදා ගනු ලබන ප්‍රමාණාත්මක නිර්ණායක 2ක් දක්වන්න.

iv. පහත දක්වා ඇති ව්‍යාපාර සංවිධානවල වාසිය හා අවාසිය බැගින් දක්වන්න.

| ව්‍යාපාර සංවිධානය | වාසි | අවාසි |
|---|---|---|
| තනි පුද්ගල ව්‍යාපාර | | |
| හවුල් ව්‍යාපාර | | |

v. පහත දැක්වෙන ශිර්ෂ යටතේ දී ඇති ව්‍යාපාර වර්ග 2හි අසමානතා දක්වන්න.

| | සීමා සහිත සමාගම් | රාජ්‍ය සංස්ථා |
|---|---|---|
| අයිතිය<br>ප්‍රාග්ධනය සපයා ගැනීම<br>කළමණාකාරණය<br>වගකීම | | |

ලකුණු 10

## II කොටස

05) රත්ජනගේ ව්‍යාපාරයේ සිදුවූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ

ජනවාරි 01 ප්‍රාග්ධනය යෙදවීම රු. 700000
02 ව්‍යාපාරයේ පාවිච්චිය සඳහා කාර්යාල උපකරණ මිලදී ගැනීම් රු. 100000
03 භාණ්ඩ මිලදී ගැනීම් රු. 60000
04 භාණ්ඩ ණයට ගැනීම් රු. 90000
05 අයිතිකරුගේ පෞද්ගලික රක්ෂණ වාරිකය ගෙවීම රු. 1000
06 අත්පිට විකුණුම් රු. 150000
07 රක්ෂණ ගාස්තු ගෙවීම් රු. 8000
08 ණයට විකුණුම් රු. 70000
09 ණය හිමියන්ට ගෙවීම
10 ණය ගැතියන්ගෙන් මුදල් ලැබීම් රු. 60000

අවශ්‍ය වන්නේ

ඉහත ගනුදෙනු ලෙජර් ගිණුම්වල ගිණුම්ගත කරන්න. ලකුණු 10

06) කුමාරගේ ව්‍යාපාරයේ 2016 ජනවාරි මාසය තුළ සිදුවූ ගණුදෙනු කිහිපයක් පහත දැක්වේ.

ජනවාරි 01 ප්‍රාග්ධනය වශයෙන් රු. 400000ක් ආයෝජනය කිරීම
04 අත්පිට භාණ්ඩ මිලදී ගැනීම් රු. 100000
09 රු. 60 000ක් පිරිවැය වූ භාණ්ඩ රු. 80000කට විකිණීම
14 විදුලි ගාස්තු ගෙවීම් රු. 10000
18 ලද කුලි ආදායම් රු. 20000
20 රු. 200000 ක් වටිනා බැංකුණයක් ලබා ගැනීම
28 රු. 30000ක් වටිනා භාණ්ඩ රු. 50000කට ණයට විකිණීම
29 ණය ගැතියන්ගෙන් 30000ක් ලැබීම
30 අයිතිකරු 5000ක් වටිනා භාණ්ඩ සිය පාවිච්චියට ගැනීම
31 රු. 2000ක පොළිය ඇතුලත්ව රු. 20000ක් බැංකු ණය වාරිකය ගෙවීම

අවශ්‍ය වන්නේ,

පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට ඉහත ගනුදෙනුවලින් සිදුවන බලපෑම වටිනාකම් සහිතව දක්වන්න.

වත්කම් = හිමිකම් + වගකීම්

තොගය + ණය ගැති + මුදල් = හිමිකම් + බැංකු ණය

ලකුණු 10

28.01.2016
ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍ය. II 10 ශ්‍රේණිය

07) කුසුම්ගේ ව්‍යාපාරයේ ගිණුම් ලිපිකරු විසින් 2016 ජනවාරි මාසය සඳහා පිළියෙල කළ මුදල් පොත පහත දැක්වේ.

මුදල් පොත

| දිනය | ලදු. අංකය | විස්තරය | ස පි. | වටිනාකම | දිනය | වවු. අංකය | විස්තරය | ස පි | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01.01 | 01 | ප්‍රාග්ධනය | | 500000 | 01.10 | 01 | උපකරණ | | 150000 |
| 01.05 | 02 | බැංකුණය | | 200000 | 01.13 | 02 | ගැනුම් | | 250000 |
| 01.06 | 03 | විකුණුම් | | 300000 | 01.16 | 03 | දුරකථනගාස්තු | | 10000 |
| 01.26 | 04 | ණය ගැති | | 100000 | 01.19 | 04 | බැංකුණය පොළී | | 5000 |
| 01.29 | 05 | කුලී ආදායම් | | 50000 | 01.23 | 05 | ණය හිමි | | 35000 |
| | | | | | | | | | |
| | | | | | 01.31 | | ශේෂය ප/ගෙ | | 700000 |
| | | | | 1150000 | | | | | 1150000 |
| 02.01 | | ශේෂය ඉ/ගෙ | | 700000 | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

අවශ්‍ය වන්නේ,

ඉහත මුදල් පොතේ සටහන් කරන ලද ගණුදෙනු මොනවාදැයි දින පිළිවෙල අනුව ඉදිරිපත් කරන්න.

ලකුණු 10